**අයගම ප්‍රාදේශීය සභාව - 2021**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

අයගම ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අයගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**----------------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ආදායම රු. 18,613,759 ක් වුවද, එය රු. 34,201,746 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2022 අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට මුද්දර ගාස්තු ඌන වෙන්කිරීම් නිවැරදිව හඳුනා නොගෙන ගැලපීම් සිදු කිරීමෙන් හිඟහිටි මුද්දර ගාස්තු ගිණුමේ ශේෂය රු. 2,049,912 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 ගිණුම් තැබීමේදී උපචිත පදනම මත වාර්ෂික ඇස්තමේන්තුව පාදක කර ගනිමින් ගිණුම් තැබීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන නිවැරදි පදනමින් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2020 වර්ෂය සඳහා හිඟහිටි කුලී ආදායම් රු. 637,757 ක් සමාලෝචිත වර්ෂය තුල ආධාර මුදල් දායක මුදල් සහනාධාර ගිණුම මඟින් කපාහැරීමෙන් වර්ෂය සඳහා වන පුනරාවර්තන වියදම ඊට සමාන වටිනාකමකින් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 අවසන් ගිණුම සැකසීමේදී රු. 637,757 ක මුදල සමුච්චිත අරමුදල මඟින් ගලපන බව. | නිවැරදි ගිණුම් මඟින් ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුල පිරිවැය රු. 540,000 ක මාර්ග තලනයක් අපහරණය සිදුකර තිබුණද, එහි පිරිවැය ලෙස රු. 260,000 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. | අඩුවෙන් ගිණුම් තැබූ රු. 280,000 ක මුදල සඳහා 2022 අවසන් ගිණුම් සැකසීමේදී ගැලපීම් කරන බව. | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 1,627,450 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 1,466,943 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **අක්කර බදු**<br>2022 අගෝස්තු 17 දිනය වනවිට අක්කර බදු ඒකක 277 කින් රු. 164,542 ක් අයකර ගතයුතුව පැවතුණි. | සභාවේ ක්ෂේත්‍ර නිලධාරීන් මඟින් අක්කර බදු සමීක්ෂණයක් සිදු කරන බව හා 2022 වර්ෂය තුලදී කේ පෝරම මඟින් ඉඩම් හිමියන් දැනුවත් කර ශේෂය අවම කර ගැනීමට කටයුතු කරන බව. | අයවිය යුතු ආදායම් හඳුනාගෙන කාලීනව අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2019 ජූලි 30 දිනැති ගිවිසුම් පත්‍රය ප්‍රකාරව කෘෂි බෝග අලෙවි මධ්‍යස්ථානයේ කඩකාමර සඳහා ගිවිසුම් අත්සන් කරන දිනට මුළු පෙර ගෙවුම් මුදල (Key Money) වාරික මුදලින් අඩක් ගෙවිය යුතු බවත්, ඉතිරි මුදල මාස 06 තුල ගෙවා නිම කලයුතු බවත් දන්වා තිබුණද, විගණිත දිනය වනවිටත් කඩකාමර 03 කට අදාල රු. 470,000 ක පෙර ගෙවුම් මුදල් (Key Money) අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | පෙර ගෙවුම් මුදල් සහ වාරික මුදල් ගෙවීම් පැහැරහරින බදුකරුවන් සම්බන්ධයෙන් මහා සභාව දැනුවත් කර ඒ සම්බන්ධයෙන් ගතහැකි පියවර පිළිබඳ තීරණයක් ගැනීමට කටයුතු කරන බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගත යුතුය. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති 03/2020 චක්‍රලේඛයේ 06(iv) වගන්තිය ප්‍රකාරව මාසික බදු කුලිය අඛණ්ඩව මාස 03 ක කාලයක් නොගෙවා ඇතිවිට අදාල කඩකාමරයේ සන්තකය | චක්‍රලේඛය අනුව වූ කොන්දේසි අදාල ගිවිසුම් සඳහා ඇතුලත් කරනු ලබන බවත්, හිඟ මුදල කොටස් වශයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | සභාවට අයවිය යුතු ආදායම් කාලීනව අයකර ගත යුතුය. |

පළාත් පාලන ආයතනය වෙත පවරා ගෙන නැවත ටෙන්ඩර් කල හැකි වන පරිදි කොන්දේසි ගිවිසුමට ඇතුලත් කලයුතු වුවද, එවැනි කොන්දේසියක් ගිවිසුමට ඇතුලත් කිරීමකින් තොරව සභාව සතු කඩකාමර 15 කින් මාස 02 සිට මාස 22 දක්වා හිඟහිටි අයවිය යුතු කඩකුලී රු. 938,226 ක් විගණිත දිනය වනවිටත් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් රු. 17,748,000 ක ණය මුදලක් යොදවා දෙමහල් වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2021 ජූලි 29 දින රු. 19,787,100 ක වැඩ වටිනාකමක් යටතේ ගිවිසුම්ගතවීමෙන් පසු 2021 අගෝස්තු 10 දිනැති සභා තීරණය අනුව ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉඩම වෙනුවට ඊට යාබද ඉඩම සුදුසු බව ප්‍රාදේශීය සභාව තීරණය කිරීම හේතුවෙන් ඇස්තමේන්තුගත වියදමට වඩා වැඩි මුදලක් ව්‍යාපෘතිය සඳහා දැරීමට සිදුවන බවත්, වැඩ අවසන් කිරීමට නියමිත 2022 ජූලි 31 දින වනවිට අදාල කාර්යය නිමකල නොහැකි බවත්, නව වියදම් ඇස්තමේන්තුවක් හා දින දීර්ඝ කිරීමක් ලබාදෙන ලෙසත් කොන්ත්‍රාත්කරු ඉල්ලා තිබුණි. ඒ අනුව ඉදිකිරීම් ස්ථානය නිශ්චය කිරීමකින් තොරව ව්‍යාපෘතිය සැලසුම් කිරීම මගින් ණය මුදල ලබා ගැනීමේ අරමුණු හා ව්‍යාපෘතියේ අරමුණු ඉටු කරවා ගැනීමට අපොහොසත් වී තිබුණි. | ඉදිකිරීමේ ස්ථානය වෙනස් කිරීම මත සභාවට පාඩුවක් සිදුවී ඇති බව දැක්වුවද, ජාතික ප්‍රතිපත්තියේ එන අයගම කුඩා නගරයක් ලෙස සමස්ථ අංගෝපාංගයන් නිසියාකාරව සඵලදායීව ස්ථානගත කිරීම තුළ අගතියක් සිදුව නොමැති බවත්, උද්ධමනකාරී තත්ත්වය මත නව ඇස්තමේන්තුවක් සැකසීමට සිදුව ඇති බවත්, මේ වනවිට තාවකාලිකව ඉදිකිරීම් නතර කර ඇති බව. | ලබා ගන්නා ණය විධිමත්ව හා කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |